# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/109/2021 (PSC)

පී.එම්.කේ.පී.පණ්ඩිතසේකර
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.04.07**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක පෞද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් මනේෂා නිශ්ශංක මිය.

**-<u>නියෝගය</u>-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

**පී.එම්.කේ.පී.පණ්ඩිතසේකර යන අය විසින්, මෙම විනිශ්චය අධිකාරය වෙත 2021.12.16 දිනැති අභියාචනා පෙත්සම ඉදිරිපත් කරමින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, 2021.05.13 දිනැති ලිපිය මඟින් ඇය වෙත දැනුම් දී ඇති විනය නියෝගය ඉවත් කරන ලෙස අයැද ඇත. එම විනය නියෝගය පැනවීමට හේතුවී ඇති, ඇයට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා වලට ඇය නිවැරදිකරු බවට ප්‍රකාශ කරන ලෙසටත් ඇය විසින් ඉල්ලා ඇත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂක ජනරාල් විසින්, 2019.12.20 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දන්වා ඇත්තේ, ඇය වෙත නිකුත් කර තිබූ 2018.07.24 දිනැති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවැත්වූ විනය පරීක්ෂණයෙන් අනතුරුව, එකී චෝදනා පත්‍රයේ අංක IV චෝදනාවෙන් ඇය නිදහස් කරන බවත්, ඉතිරි අංක 1, 2, 3, 5 සිට 11 දක්වා වන චෝදනා වලට ඇය වරදකරු බවට තීරණය කරන ලද බවත් ය.**

අභියාචකට විරුද්ධව ඉදිරිපත් කර ඇති I වන චෝදනාව වන්නේ, කම්කරු විනිශ්චය සභාවේ භාණ්ඩ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුව තිබූ, කම්කරු විනිශ්චය සභාවේ පූර්වගාමි සභාපතිවරයෙකු වූ, කේ.එම්.එම්.ඉසෙඩ් අම්ජාඩ් යන අයගේ නිල රථයෙන් ඉවත් කරනු ලැබූ ටයර් 04ක්, අදාළ භාණ්ඩ ලැයිස්තුවට ඇතුළත් නොකර, කම්කරු විනිශ්චය අධිකාරයෙන් බැහැරව ගෙන යාම හා/හෝ ඒවා පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගෙන තිබීමයි.

මෙම සිද්ධියේ දී ප්‍රධාන වශයෙන්ම ඉදිරිපත් කර ඇති බරපතලම චෝදනාව වන්නේ එකී පළවන චෝදනාවයි. අභියාචක සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණය පවත්වන ලද අවස්ථාවේ දී, ඉහත කී අම්ජාඩ් යන අයට රජයේ වාහනයක් ලබා දී තිබුණේ ද යන ප්‍රශ්නය මතුවී තිබුණි. ඒ අනුව එම වාහනය රජයේ වාහනයක් ද, නැද්ද යන්න පරීක්ෂා කර බලා, විනිශ්චය අධිකාරය වෙත වාර්තා කරන ලෙසට දෙපාර්ශවයටම දැනුම් දෙන ලදි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, ඉදිරිපත් කරන ලද 2025.11.25 දිනැති ලිපිය සමඟ, කුලියාපිටිය කම්කරු විනිශ්චය සභාවේ සහකාර ලේකම් විසින් ඉදිරිපත් කරන ලද 2025.11.17 දිනැති ලිපියේ පිටපතක් ඉදිරිපත් කර ඇත. එම ලිපියේ පැහැදිලිව සඳහන් වී ඇත්තේ, අදාළ කාලපරිච්ඡේදය තුළ මෙම කම්කරු විනිශ්චය සභාවේ එවකට සිටි සභාපති සඳහා වෙන් කරන ලද රජය සතු නිල රථයක් තිබී නොමැති බවයි. එම කාල සීමාව තුළ සභාපතිව සිටි කේ.එම්.එම්.ඉසෙඩ්.එම්. අම්ජාඩ් මහතා, ඔහුගේ නිල රථය ලෙසට KD 1971 දරණ මෝටර් රථය භාවිතා කර ඇති බව එහි වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් අභියාචක විසින්, අම්ජාඩ් යන අය වෙත අදාළ කාලසීමාව තුළ ගෙවන ලද වැටුප් වාර්තා දෙකක පිටපත් ද ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2019.01.19 දිනැති සහ 2012.02.21 දිනැති වැටුප් වාර්තා දෙක මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත. එම වැටුප් වාර්තා දෙක අනුව කේ.එම්.එම්.එස්.එම්.අම්ජාඩ් යන කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරයා විසින්, වාහන දීමනාව වශයෙන් මසකට රු.30,000/=ක මුදලක් ලබාගෙන ඇති බව පෙනී යයි.

එසේ නම් ඔහු වෙත රජය සතු නිල වාහනයක් ලබා දී නොමැති බව පැහැදිලිව පෙනී යයි. එවැනි තත්ත්වයක් යටතේ අම්ජාඩ් යන අය භාවිතා කරන ලද රජයේ නිල වාහනයකට යොදන ලද ටයර් පාවිච්චි කර තිබුණා යැයි කරනු ලබන චෝදනාව සම්පූර්ණයෙන්ම බිඳ වැටී යනවා ඇත. එවැනි තත්ත්වයක් යටතේ පළවන චෝදනාවට අභියාචක වරදකරු කර තිබීම ඉතාමත් බලවත් වරදකි. ඒ අනුව පළවන චෝදනාවට අභියාචක වරදකරු කිරීම දෝෂ සහගත වේ.

මීළඟට සඳහන් කළ යුතු වන්නේ, අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ දෙවන හා තුන්වන චෝදනා ඉදිරිපත් කිරීමට පදනම් කරගෙන ඇති කරුණුයි. අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සාක්ෂි දී ඇති තවත් සාක්ෂිකරුවකු වන්නේ, කම්කරු විනිශ්චය සභා කර්යාලයේ මුරකරු ලෙස කටයුතු කළ පුද්ගලයාය. ඔහු, කම්කරු විනිශ්චය සභා සභාපතිනියගේ පෞද්ගලික කටයුතු වලද යෙදුන බවටත් කරුණු ඉදිරිපත්වී ඇත. එවැනි තත්ත්වයක් යටතේ ඔහුගේ සාක්ෂියෙහි ඇති වැදගත්කම හීනවී යනවා ඇත.

තවද, අභියාචක කම්කරු විනිශ්චය සභා කාර්යාලයේ, පරිපාලනය පිළිබඳව වගකිවයුතු නිලධාරිණියක ලෙස කටයුතු කරමින්, සේවකයින්ට තදින් ක්‍රියා කරමින් සිටි අයෙකු බවට ද සාක්ෂි වලින් හෙළිදරව් වී ඇත. එවැනි තත්ත්වයක් යටතේ සේවකයින් ඇය හා සමග අමනාපකම් තිබුණ බවත් ඉදිරිපත් වන තවත් කරුණකි. තවද, මෙම කාර්යාලයේ පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඇති කම්කරු විනිශ්චය සභා අතර පැවැත්වූ තරඟ වලින්, ප්‍රථම ස්ථානය ලබා ගැනීමට හැකි වූ බවට අභියාචක විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එවැනි සාර්ථකත්වයක් හිමිකරගෙන තිබීම සම්බන්ධයෙන් වන සාක්ෂි ප්‍රතික්ෂේප කළ නොහැක. මෙවැනි තත්ත්වයක් යටතේ අභියාචක වෙත චෝදනා ඉදිරිපත් කර තිබූ බව ඇය විසින් සඳහන් කර ඇත. එම කරුණු ප්‍රතික්ෂේප කළ නොහැක.

ඉදිරිපත් කර තිබූ 04 වන චෝදනාව සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ වාර්තාවේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ, එම චෝදනාව ඔප්පු නොවුන බවට ඔහු විසින් නිගමනය කරන ලද බවයි. එම තීරණයට හේතුව ලෙස ඔහු දක්වා ඇත්තේ, එම චෝදනාව සනාථ කිරීම සඳහා ප්‍රමාණාත්මක ලෙසින් හා විශ්වසනීයත්වයෙන් යුත් සාක්ෂි ඉදිරිපත් නොවීමෙන් ඒ සම්බන්ධයෙන් සාක්ෂි දී ඇති පී.එම්.අයි.කේ.රාජපක්ෂ යන අයගේ සාක්ෂිය දුර්වල එකක් වූ බවත් ය. එකී IV චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇති හෙයින්, ඒ සම්බන්ධයෙන් වන සාක්ෂි සළකා බැලීම අවශ්‍ය නොවේ.

විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ V වන චෝදනාව සම්බන්ධයෙන් සිය වාර්තාව ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, කිසියම් පෙත්සමක් මත මෙම සිද්ධිය පැන නැඟී ඇති බවත්, එම පෙත්සම සම්බන්ධයෙන් සදීප ජයම්පති මහතාට බැන වැදුනාය යන කරුණ සනාථ නොවී ඇති බවත් ය. එහි වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, කිසියම් පෙත්සමක් මත, ඉදිරිපත් වූ කරුණු හේතුවෙන් එම චෝදනාව ඉදිරිපත් කර තිබූ බවයි. බැන වැදීමක් යන කරුණ සාක්ෂි මගින් සනාථ වී නොමැත. ඒ අනුව එම චෝදනාවට වරදකරු බවට පත් කිරීම දෝෂ සහගත වේ.

VI වන චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, ඉහතකී V වන චෝදනාවෙහි සඳහන්වූ පෙත්සමේ කරුණු විමසීමකදී උද්ගත වූ තත්ත්වයක් සම්බන්ධයෙනි. ඒ අනුව එම චෝදනාව ද ඔප්පු වී ඇති බවට ගෙන ඇති තීරණය සාවද්‍ය වනවා ඇත.

VII වන චෝදනාව, කාර්යාලයේ සේවය කරන අනික් නිලධාරීන්ට පරුෂ වචනයෙන් බැන වදිමින්, තර්ජනය කර තිබීම යන කරුණට අදාළව ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් සාක්ෂි දී ඇති සී.ඩී.එම්.සඳමාලි, ඩී.කේ.පන්නිල ගමගේ, සහ ක්‍රිෂාන්ති මංගලිකා ගුණවර්ධන යන අයගේ සාක්ෂි වලින් පවසා ඇත්තේ, ඔවුන් ඉදිරියේ අභියාචක විසින් ඔවුන්ට බැන වැදීමක් නොකළ බවයි. මෙම සාක්ෂිකරුවන් සියළු දෙනාම සඳහන් කර ඇත්තේ, ඔවුන් නැති තැන විවේචනය කරනවා, බනිනවා යනුවෙනි. ඒවා වෙනත් කෙනෙකු විසින් ඔවුන් වෙත දැන්වූ දෑ පමණි. සාක්ෂිකරුවන්ගේ එවැනි සාක්ෂි මත, යම් කෙනෙකු වරදකරු බවට පත් කිරීම දෝෂ සහගත වේ.

VIII වන චෝදනාව වන්නේ, භාෂන පරිවර්තක අර්ශානා මහත්මිය හා අනිකුත් නිලධාරීන් වෙත මරණ තර්ජනය කිරීම මගින් වරදක් සිදුකර ඇති බවයි. අර්ශානා යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, අභියාචක ඇයගේ නිවසට පැමිණ ආපසු යන අවස්ථාවේ දී, අභියාචක විසින් "***පිහියක් අරගෙන, උඹලා ඔක්කොටම ඇණගෙන, ඇණගෙන යනවා***" කිව්ව බවයි. එකී තර්ජනය සම්බන්ධයෙන්, පොලීසියට පැමිණිල්ලක් හෝ කර තිබේදැයි හරස් ප්‍රශ්න මගින් විමසා ඇති නමුත්, එවැනි පැමිණිල්ලක් ඇය විසින් සිදුකර නොමැති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත.

09 වන චෝදනාවෙන් චෝදනා කර ඇත්තේ, අර්ශානා සහ දර්ශිකා හේරත් යන දෙදෙනාගේ පෞද්ගලිකත්වයට දැඩි ලෙස හානි වන අයුරින්, අපහාසාත්මක චෝදනා ඉදිරිපත් කර තිබීමක් පිළිබඳවයි. කලින් සඳහන් කර ඇති පරිදිම එකී සාක්ෂිකරුවන් ඉදිරියේ අපහාසාත්මක චෝදනා කර ඇති බවට ඉදිරිපත් වූ සාක්ෂිද පිළිගත හැකි ආකාරයෙන් ඉදිරිපත් කර නැත.

ඉහත සඳහන් පරිදි ඉදිරිපත් වී තිබූ සාක්ෂි විමසා බැලීමෙන් පසුව, මෙහිදී විශේෂයෙන් සළකා බැලිය යුතු වන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා ඉදිරිපත් කිරීමට හේතු සාධක වූ පසුබිමයි. ඉහතින් සඳහන් කර ඇති පරිදි, කම්කරු විනිශ්වය සභාවේ මුරකරුව සිටි ඩී.එම්.රොෂාන් ආනන්ද දසනායක යන අය කම්කරු විනිශ්වය සභා සභාපතිනියගේ පෞද්ගලික කටයුතු වල ද යෙදී ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී තිබුණි. මෙම සිද්ධියට මුල් වී ඇත්තේ මෙම අය විසින් කරන ලද පැමිණිල්ලකි. මෙම පැමිණිල්ල මත පළමු චෝදනාවට අදාළ වන

පැරණි ටයර් අවභාවිතා වූ බවට කරුණු ඉදිරිපත් වී තිබුණි. එම ටයර් රජය සතු නොවන බව මෙම විනිශ්චය අධිකාරය වෙත, ලේඛන වශයෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත සාක්ෂි මගින් අනාවරණය වී ඇත. ඒ අනුව සිද්ධියට පාදක වූ හේතු ව, මුල් අවස්ථාවේ සිටම සම්පූර්ණයෙන්ම වැරදි සහගත කරුණු පදනම් කරගෙන, මෙම චෝදනා ඉදිරිපත් කර තිබූ බව මෙහිදී සඳහන් කළ යුතුය.

ඉහත සියළු කරුණු සළකා බැලීමේදී, අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා වලට වරදකරු බවට පත්කර තිබීම නිවැරදි නොවේ. ඒ අනුව අභියාචකට විරුද්ධව ඉදිරිපත් කර ඇති එකී සියළු චෝදනා වලින් ඇයව නිදොස් කර නිදහස් කිරීමට තීරණය කරමු.

ඒ අනුව ඇය වෙත **2021.05.13** දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවා ඇති විනය දඬුවම් සියල්ල ඉවත් කිරීමට තීරණය කරමු.

ඉහත තීරණයන් ඒ අයුරින් ක්‍රියාත්මක කර, මෙම විනිශ්චය අධිකාරය වෙත වාර්තා කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියෝග කරමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-